INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

**මාධ්‍ය නිවේදනය: යුද අපරාධ චෝදනා එල්ල වූ අයකු ස්වකීය හමුදා නායකත්වයට පත්කිරීම මගින් ශ්‍රී ලංකාව සිය ජනයා පාවාදෙයි.**

2019 අගෝස්තු 19


W ITJPSL.COM

E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:

YASMIN SOOKA


**ජොහැන්නස්බර්ග්:** යුද අපරාධකරුවකු වශයෙන් චෝදනා ලද කුප්‍රකට මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා යුද හමුදාපතිවරයා වශයෙන් පත්කිරීමට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා ගනු ලැබ ඇති තීරණය වූ කලී, ඔහුට එල්ලව ඇති යුද අපරාධ හා මානව වර්ගයාට එරෙහි අපරාධ පිළිබඳ චෝදනා සළකා බැලීමේදී, රටට ඉමහත් හානිකර වූ ද, කවර හෝ සංහිඳියා ක්‍රියාවලියක අවසානය සළකුණු කරන්නා වූ ද පියවරකි.

මේ වසරේ ජනවාරියේ දී සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතිය විසින් ප්‍රකාශයට පත්කරන ලද පිටු 137කින් යුතු ශවේන්ද්‍ර සිල්වා පිළිබඳ තොරතුරු ගොනුව මගින් යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ සම්බන්ධයෙන් ඔහුට එරෙහිව නඩු පැවරීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා සාක්ෂි ඇති බැව් පෙන්වා දෙනු ලැබුණි. එසේ තිබියදීත්, යුද හමුදාවේ වඩාත්ම බලවත් තනතුර වෙත ඔහුව උසස් කොට ඇත්තේ වැදගත් මැතිවරණයකට මාස කිහිපයකට පෙරාතුව ය.

“මේ වනාහී ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමට සිය උත්සුකභාවය පෙන්වූ පුද්ගලයෙක්”යැයි සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතියෙහි විධායක අධ්‍යක්ෂිකා යස්මින් සූකා පැවසුවාය. “ඔහුගේ උසස්වීම පොදුවේ මුළු රට පුරාත්, විශේෂයෙන්ම සිල්වාගේ අධීක්ෂණය යටතේ සිවිල් ස්ථානවලට ප්‍රහාර දියත් කළ බවට චෝදනා එල්ල වූ 2009දී අතිමහත් හානි අත්විඳි සිය දහස් සංඛ්‍යාත දෙමළ ජනයා අතරත් භීතියක් ජනිත කරනු ඇත.”

හිරිනීතික ඝාතන, බලහත්කාරී අතුරුදහන් කිරීම්, වධ බන්ධන, ලිංගික හිංසන හා දහස් සංඛ්‍යාත තරුණ පිරිස් රඳවා තැබීම පිළිබඳ විශ්වාසනීය චෝදනා එල්ල වූ අසූව දශකයේ අග භාගයේ ජනතා විමුක්ති පෙරමුණේ නැගී සිටීම මර්දනය කිරීමෙහිලා ශවේන්ද්‍ර සිල්වා ඉටුකළ භූමිකාව සම්බන්ධයෙන් ද ඔහු කිසිදු විටෙක වගඋත්තරදායක කොට නැත. ඇතැම් මානව හිමිකම් උල්ලංඝණයන් සිදුවූයේ, එවකට ගෝඨාභය රාජපක්ෂගේ විධාන වගකීම යටතේ ක්‍රියාත්මක වූ ගජබා රෙජිමේන්තුවේ පළමු බල ඇණියට අනුයුක්තව ශවේන්ද්‍ර සිල්වා සේවය කළ මාතලේ ප්‍රදේශය තුළ ය.

“අති විශාල ලේ වැගිරීම්වලින් පසුව, නැවත නැවත සිදුවන ප්‍රචණ්ඩ චක්‍රයන් නවත්වන්නට නම් සිය නායකයන් වගඋත්තරදායක කිරීමට ශ්‍රී ලාංකිකයන් ක්‍රියාකළ යුතුයි. කෙසේ වුවත්, සිල්වාට ලබාදුන් උසස්වීම පූර්ණ දණ්ඩ මුක්තිය පිළිබඳ පණිවිඩයක් ලබා දී තිබේ” යැයි යස්මින් සූකා වැඩි දුරටත් කියා සිටියාය.

ශ්‍රී ලංකා යුද හමුදාවට එක්සත් ජනපදය විසින් ලබාදෙන ආධාර පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් සිල්වාගේ අභිනව පත්කිරීම විසින් මතු කරන්නේ, දණ්ඩ මුක්තිය සහිතව මානව හිමිකම් උල්ලංඝණයෙහි යෙදෙන විදේශ හමුදා ඒකකයන්ට යුදමය ආධාර ලබාදීම වළකාලන ලේහි නීති මාලාව (Leahy Laws) එවැනි ආධාර කෙරෙහි බලපාන බැවිනි. ශ්‍රී ලංකාව විසින් මෑත දී එක්සත් ජාතීන්ට සාම සාධක කාර්යයන්හි යෙදවීමට අවශ්‍ය සෙබළුන් සැපයීම නැවත ආරම්භ කිරීම කෙරෙහි ද බලපෑමේ විභවයක් මෙම පත්කිරීමට තිබේ. 2018 වසරේ වැඩි කාලයක් පුරා සාම සාධක කාර්යයන්හි යෙදවීම් අත්හිටුවා තිබූ අතර, 2008-9 වකවානුවේ යුද අපරාධ සිදු වූ බවට චෝදනා එල්ල කෙරෙන ප්‍රදේශවල සටන්වල නිරතව සිටි (සිල්වා යටතේ වූ 58වැනි බල සේනාව වැනි) ඒකකයන්ට අයත් සෙබළුන් සාම සාධක කාර්යයන්ගෙන් බැහැර කර තබනු පිණිස තදබල පූර්ව සුපරීක්ෂණ වැඩපිළිවෙලක් ද ක්‍රියාත්මක කරනු ලැබුණි.

“සියළුම අනිසි ප්‍රතිවිපාක පෙන්වාදීම මගින්, ශ්‍රී ලංකාව මෙම පියවර ගනු ලැබීමෙන් වළකාලීමට තීව්‍ර රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීම් සිදුවන්නට ඇතැයි මට සිතාගැනීමට පුළුවන. කිසියම් රටක් මෙම පියවර ගැනීම තමන්ටම එරෙහිව ගන්නා ක්‍රියාමාර්ගයක් වන අතර විශේෂයෙන්ම නීතියේ ආධිපත්‍යයට සෘජුවම අනර්ථකාරී ලෙස බලපාන එකකැ’යි සූකා වැඩි දුරටත් ප්‍රකාශ කළාය.

“ශ්‍රී ලංකාවේ මිත්‍ර පාක්ෂිකයන් දැන් මූලධාර්මික පියවරක් ගනු ඇතැයි ද, නිල රාජකාරියක් සඳහා හෝ ශවේන්ද්‍ර සිල්වාට විදේශගත වීමට වීසා බලපත් ලබා නොදෙනු ඇතැයි මම උදක්ම අපේක්ෂා කරමි.”

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT